# WEATHER FORECAST FOR 19 DECEMBER 2019

**(Issued at 12.00 noon on 18 December 2019)**

**Showery condition over the island, particularly in Northern, Eastern and Uva provinces and in Polonnaruwa district is expected to enhance further.**

Showers or thundershowers will occur at times in Northern, Eastern, North-Central, Uva and Central provinces and in Hambanthota district. Showers or thundershowers will occur at several places elsewhere after 2.00 p.m. Light showers may occur in western and North-western provinces in the morning too.

Heavy falls about **(100-150) mm** are likely at some places in Eastern and Uva provinces and in Nuwara-Eliya, Matale, Polonnaruwa and Mullaitivu districts. Fairly heavy falls about **75-100 mm** are likely at some places in Sabaragamuwa and Western provinces and in Kandy, Hambanthota and Galle districts.

Wind speed can be increased up to **50 kmph** at times in North-Central, North-western, Central and Uva provinces and in Hambanthota district.

Misty conditions can be expected at some places in Western and Sabaragamuwa provinces during the morning.

**General public is kindly requested to take adequate precautions to minimize damages caused by temporary localized strong winds and lightning during thundershowers.**

දිවයින පුරා, විශේෂයෙන් උතුරු, නැගෙනහිර සහ ඌව පළාත්වලත් පොලොන්නරුව දිස්ත්‍රික්කයේත් වැසි තත්ත්වයේ වැඩි වීමක් තවදුරටත් බලාපොරොත්තුවේ.

උතුරු, නැගෙනහිර, උතුරු-මැද, ඌව සහ මධ්‍යම පළාත්වලත් හම්බන්තොට දිස්ත්‍රික්කයේත් විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ. දිවයිනේ සෙසු ප්‍රදේශවල ප.ව. 2.00 න් පමණ පසුව තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ. බස්නාහිර සහ වයඹ පළාත්වල උදෑසන කාලයේදී ද සිහින් වැසි ඇති විය හැක.

නැගෙනහිර සහ ඌව පළාත්වලත් නුවරඑළිය , මාතලේ,පොලොන්නරුව සහ මුලතිව් දිස්ත්‍රික්කවලත් ඇතැම් ස්ථාන වලට **මි.මී. (100-150)** පමණ තද වැසි ද, සබරගමුව සහ බස්නාහිර පළාත්වලත් මහනුවර, හම්බන්තොට සහ ගාල්ල දිස්ත්‍රික්කවලත් ඇතැම් ස්ථාන වලට මි.මී. 75-100 පමණ තරමක් තද වැසි ද ඇතිවිය හැක.

උතුරු-මැද, වයඹ, මධ්‍යම සහ ඌව පළාත්වලත් හම්බන්තොට දිස්ත්‍රික්කයේත් සුළඟේ වේගය විටින් විට පැ.කි.මී. 50 දක්වා වැඩි විය හැක.

බස්නාහිර සහ සබරගමුව පළාත්වල උදෑසන කාලයේදී ඇතැම් ස්ථානවල මීදුම් සහිත තත්ත්වයක් බලාපොරොත්තු විය හැක.

ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළං වලින් සහ අකුණු මඟින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

## WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS (Issued at 1200 noon on 18 December 2019)

Showers or thundershowers will occur at several places in the sea areas extending from Mullaitivu to Matara via Batticaloa, Pottuvil and Hambanthota. Heavy falls are likely at some places in the sea areas extending from Batticaloa to Hambanthota via Pottuvil.

Showers or thundershowers will occur at several places in the sea area extending from Mannar to Matara via Colombo and Galle during the afternoon or night.

Winds will be North-easterly and speed will be **(20-40)** kmph in the sea areas around the island.

**The sea areas extending from Trincomalee to Negombo via Kankasanturai, Mannar and Puttalam and the sea areas extending from Matara to Pottuvil via Hambanthota can be fairly rough at times as the wind speed can increase up to (50-55) kmph at times.**

**Temporarily strong gusty winds (up to 70-80 kmph) and very rough seas can be expected during thundershowers.**

## ඉදිරි පැය 24 සඳහා දිවයින වටා ඇති මුහුදේ කාලගුණ තත්ත්වය
## 2019 දෙසැම්බර් මස 18 දින මධ්‍යහන 12.00 ට නිකුත් කරන ලදි.

මුලතිවු සිට මඩකලපුව, පොතුවිල් සහ හම්බන්තොට හරහා මාතර දක්වා වන මුහුදු ප්‍රදේශවල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ. මඩකළපුව සිට පොතුවිල් හරහා හම්බන්තොට දක්වා වන මුහුදු ප්‍රදේශවල ඇතැම් ස්ථාන වලට තද වැසිද ඇති විය හැක.

මන්නාරම සිට කොළඹ සහ ගාල්ල හරහා මාතර දක්වා වන මුහුදු ප්‍රදේශවල තැනින් තැන සවස් කාලයේ හෝ රාත්‍රී කාලයේ වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං ඊසාන දෙසින් හමා එන අතර සුළඟේ වේගය පැ.කි.මී. (20-40) පමණ වේ.

ත්‍රිකුණාමලය සිට කන්කසන්තුරය, මන්නාරම සහ පුත්තලම හරහා මීගමුව දක්වා වන මුහුදු ප්‍රදේශවල සහ මාතර සිට හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය විටින් විට පැ.කි.මී. (50-55) දක්වා ඉහළ යාමට හැකියාවක් පවතින අතර එම මුහුදු ප්‍රදේශ විටින් විට තරමක් රළු විය හැක.

ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල (පැ.කි.මී. 70-80 දක්වා) තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.

කාලගුණ විද්‍යාඥ (Duty Meteorologist),
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (Department of Meteorology)

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date: 2019/12/18
Time: 1245 hrs